විද්‍යාලය :- ර/තෙප්පනාව කුමාර මහා විද්‍යාලය

සිංහල භාෂාව හා සාහිත්‍යය :- 12 ශ්‍රේණිය පැවරුම්

පුරාතන ගද්‍ය සාහිත්‍යය :- අනුරුද්ධ කුමාර කතාව (පූජාවලිය )

විෂය භාර ගුරු :- ඕ.එම්.එන්.කරුණාරත්න

**01.පහත සඳහන් ඡේද කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න?**

එකෙණෙහි එනුවර අරක්ගත් දේවතා " මාගේ අනුරුද්ධ කුමාරයෝ මවුකුසින් උපන් දා පටන් නැතැයි යන බසෙහි අර්ථ නොදත්තාහුය; එබසෙහි අර්ථ දැන්පූ නම් උන්ගේ පින් බලයෙන් මා ඉස සත්කඩක්ව පැළීයයි" කියා මරණභයින් වෙව්ලා ඒ ගෙන යන්නා වූ තලියෙහි දිව්‍ය වූ සුවඳ කැවුම් මවාලීය.එවේලෙහි ගෙන ගොස් තලිය අනුරුද්ධ කුමාරයන් ඉදිරියෙහි තබාලා ගෙන ගිය පුරුෂයා **අක්කොළින්** මඳක් සිනා සී "ස්වාමීනි, තෙල නැති පූ කව මැනව"යි කියාලා මත්තෙහි තුබූ රන්තලිය ඔසවාපීය. එකෙණෙහි ඒ දිව්‍ය කැවුමෙහි සුවඳ ඒ සා මුළු නුවර මුළුල්ලෙහි හමා **බස්නට** පටන්ගත.එයින් කැවුමක් හැරගෙන දිව අග තබාලූ වේලෙහි අනුරුද්ධ කුමාරයන්ගේ සකලශරීරය පිනවාගෙන සත්දහසක් රස නහර රසයෙන් පුරා සිටගත.

1.ඉරි ඇඳි පද සඳහා අර්ථ විවරණ සපයන්න?

2.මෙහි එන අනුරුද්ධ කුමාරයන් නොදන්නේ කුමක්ද?

3."සත්දහසක් රස නහර රසයෙන් පුරා සිටගත" මෙහි අදහස කුමක්ද?

4.රසයෙන් යන්නෙහි විභක්තිය දක්වන්න?

**02**.**පහත ඒවායේ අවස්ථා සම්බන්ධය දක්වන්න**?

1. "මාගේ මලණුවෝ තමන් සිවුමැලි හෙයින් මහණ වන්නට මැලියාහුය"
2. "මාගේ හදවත හා දැස නුඹ හා සම වුව"
3. "ජාරා මරණ දෙදෙනාගේ පසු පළමු වීමෙහි විභාගයක් නැත"
4. "මට සනා ඇතියා නම් උත්තරයක් නොකියව"
5. "ස්වාමීනි, අපගේ කුලෙහි ශාක්‍යයෝ නම් ඉතා මානියහ"